# නව පළාත් පාලන ආයතන සංස්ථාපනය සහ පවත්නා පළාත් පාලන ආයතන උසස් කිරීම සඳහා නිර්ණායක නිර්දේශ කිරීමේ කමිටු වාර්තාව

2017

66

# පටුන


| | මාතෘකාව | පිටු අංකය |
|---|---|---|
| 01. | හැඳින්වීම | 3 |
| 02. | කමිටුව පත් කිරීම | 3 |
| 03. | කමිටුවේ විෂයපථය | 4 |
| 04. | කමිටුව විසින් වාර්තාව භාරදිය යුතු කාලය | 5 |
| 05. | ක්‍රමවේදය | 5 |
| 06. | පසුබිම | 7 |
| 07. | පළාත් පාලන ආයතන සංස්ථාපනයට අදාල නෛතික විධිවිධාන | 9 |
| 08. | පළාත් පාලන ආයතන සංස්ථාපනය හා පවතින ආයතන උත්ශ්‍රේණිගත කිරීමේ දී වර්තමානයේ අනුගමනය කරනු ලබන කාර්ය පරිපාටිය: | 11 |
| 09. | කමිටුවේ නිර්දේශ | 15 |

## 01.හැඳින්වීම

ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතන සංස්ථාපනය සම්බන්ධව පිළිගත් ක්‍රමවේදයක් හෝ ප්‍රතිපත්තියක් නොමැති වීම නිසා අලුතින් පළාත් පාලන ආයතන සංස්ථාපනය කිරීම මෙන්ම පවත්නා පළාත් පාලන ආයතන උසස් කිරීම විධිමත්ව සිදු නොවන බව නිරීක්ෂණය වී ඇත. මේ සඳහා යම් යම් අවස්ථා වලදී පරිපාලනමය විධිවිධාන යොදාගෙන ඇති බව දක්නට ලැබුණද ඊට අදාලව යම් විද්‍යාත්මක පදනමක් සකස් කළ යුතු බව වත්මන් පළාත් සභා සහ පාලන අමාත්‍යගරු ෆයිසර් මුස්තෆා මැතිතුමා විසින් නිරීක්ෂණය කරන ලදී.

## 02.කමිටුව පත් කිරීම

ඒ අනුව නව පළාත් පාලන ආයතන සංස්ථාපනය සහ පවත්නා පළාත් පාලන ආයතන උසස් කිරීම සඳහා පිළිගත් ක්‍රමවේදයක් සකස් කිරීමේ අරමුණින් ඊට අදාලව ජාතික නිර්ණායක පද්ධතියක් නිර්දේශ කිරීම පිණිස එතුමා විසින් 2016.05.25 දින පහත නම් සඳහන් කමිටුව පත් කරන ලදී.

**(ඇමුණුම 01)**

| | | | |
|---|---|---|---|
| 01. | නීතිඥවන්දකජයසුන්දරමහතා | - | කමිටුසභාපති |
| 02. | එස්.ඩී.ඒ.බී. බොරලැස්සමහතා | - | කමිටුලේකම් - අතිරේක ලේකම් (පළාත් පාලන හා පළාත් සභා), පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය |
| 03. | වී.කේ. නානායක්කාරමහතා | - | කමිටුසාමාජික - උපදේශක, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය |
| 04. | ඩබ්.එම්.එස්.වීරසිංහමහතා | - | කමිටුසාමාජික - නියෝජ්‍ය සර්වේයර් ජනරාල් (භූමි තොරතුරු විඥාපන) , |
| 05. | ඩබ්.ඩබ්.එම්.ඒ.එස්.ප්‍රේමකුමාරමහතා | - | කමිටුසාමාජික - අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (සංඛ්‍යාන) ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව |
| 06. | කේ.එම්.ආර්. වික්‍රමසිංහ | - | නියෝජ්‍යඅධ්‍යක්ෂ (ජනලේඛනහාසංඛ්‍යාලේඛනදෙපාර්තමේ |

| | | | |
|---|---|---|---|
| | | | න්තුව ) |
| 07. | නීතිඥගයනිප්‍රේමතිලකමිය | - | කමිටුසාමාජික - නීති නිලධාරී, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය |
| 08. | නීතිඥචාරකජයරත්නමහතා | - | කමිටුසාමාජික |
| 09. | ඩී.පී. හෙට්ටිආරච්චිමහතා | - | කමිටුසාමාජික - හිටපු අතිරේක ලේකම්, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය |
| 10. | නීතිඥපුලස්ති රූපසිංහ මහතා | - | කමිටුසාමාජික |
| 11. | ජේ.එම්.ආර්.පී.ජයසිංහමහතා | - | කමිටුසාමාජික - පළාත් පාලන කොමසාරිස්, වයඹ පළාත |
| 12. | ශලිනි රත්වත්තේ මෙය | - | කමිටුසාමාජික |

## 03.කමිටුවේ විෂයපථය

කමිටුව වෙත පහත සඳහන්විෂයපථය තුළ කටයුතු කිරීම පවරන ලදී.

1. පළාත් පාලන ආයතන බල ප්‍රදේශයේ ජනගහණය, ජනගහන ඝනත්වය,ආර්ථික සංවර්ධන මට්ටම, ආදායම් උත්පාදනය, භූගෝලීය සාධක,පවත්නා පරිපාලනමය සීමා, පවත්නා පළාත් පාලන ආයතන සීමා, පවත්නා පළාත් පාලන ආයතන කොට්ඨාශ සීමා, සහ අනෙකුත් අදාල කරුණු සැලකිල්ලට ගෙන පවත්නා පළාත් පාලන ආයතන උසස් කිරීම හෝ නව පළාත් පාලන ආයතන පිහිටුවීම සම්බන්ධව නිර්ණායක සකස් කිරීම.

2. නව පළාත් පාලන ආයතන සංස්ථාපනය හෝ පවත්නා පළාත් පාලන ආයතන උසස් කිරීම සඳහා පාදක කරගත යුතු සාධක තීරණය කිරීම සඳහා මහජනතාව, මහජන නියෝජිතයින් සිවිල් සමාජ සංවිධාන ඇතුළු සිවිල් සමාජයේ අදහස් ලබා ගැනීම

3. ඉහත 1 හා 2 සඳහන් කරුණු සැලකිල්ලට ගෙන නිශ්චිත නිර්ණායක හඳුන්වා දෙමින් ගරු අමාත්‍යතුමා වෙත වාර්තාවක් ඉදිරිපත් කිරීම.

66

## 04. කමිටුව විසින් වාර්තාව භාරදිය යුතු කාලය

ඉහත කාරණා සැළකිල්ලට ගනිමින් කමිටුව විසින් ගරු අමාත්‍යතුමා වෙත පළාත් පාලන ආයතන සංස්ථාපනය සහ උසස් කිරීම සම්බන්ධව ජාතික නිර්ණායක පද්ධතියක් සකස් කර 2016.08.31 දින වන විට භාර දීමට නියමිත වන අතර කමිටුවේ කාර්යභාරය සහ ඉල්ලීම සැලකිල්ලට ගනිමින් මෙම දිනය 2016.10.15 දින දක්වා දීර්ඝ කරන ලදී.

## 05 . ක්‍රමවේදය

මෙම කාර්යභාරය ඉටු කිරීම සඳහා කමිටුව විසින් අනුගමනය කරන ලද ක්‍රමවේදය පහත සඳහන් පරිදි වේ.

1. පුවත්පත් දැන්වීම් මගින් විවෘත මහජන අදහස් හා යෝජනා ලබා ගැනීම. (ඇමුණුම 01)

2. 1999 වර්ෂයේ පළාත් පාලන ප්‍රතිසංස්කරණ පිළිබඳ පරීක්ෂණ කොමිෂන් සභා වාර්තාවේ නිර්දේශ අධ්‍යයනය කිරීම.

3. කමිටුවේ සාමාජිකත්වය දරන ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේ නියෝජිතයා විසින් ඉදිරිපත් කරන ලද එම දෙපාර්තමේන්තුව විසින් වාර්ෂිකව යාවත්කාලීන කරනු ලබන දත්ත හා තොරතුරු අදාල කර ගැනීම.

4. කමිටුවේ සාමාජිකයන්ගේ අදහස් සැලකිල්ලට ගැනීම.

මෙහිදී පුවත්පත් දැන්වීම් මගින් මහජන අදහස් හා යෝජනා ඉදිරිපත් කිරීම සඳහා ආරාධනා කරමින් පහත සඳහන් පුවත්පත් වල දැන්වීම් පළ කරන ලදී.

| පුවත්පතේ නම | දැන්වීම පළවූ දිනය |
|---|---|
| ඩේලි නිවුස් | 2016.07.22 |
| ලංකාදීප | 2016.07.22 |
| තිනකරන් | 2016.07.22 |

මේ යටතේ ලැබුණු සෑම නියෝජනයක ම තිබූ අදහස් හා යෝජනා කමිටුව විසින් සැලකිල්ලෙන් විමසා බැලූ අතර එම යෝජනා හා අදහස් සමාලෝචනය කර, නිර්දේශ සකස් කිරීමේ දී උපයෝගී කරගන්නා ලදී.

එමෙන්ම, මෙහිදී තව දුරටත් පළාත් පාලන ආයතන සංස්ථාපනය පිළිබඳ පුළුල් වශයෙන් තොරතුරු ඇතුලත් 1999 වර්ෂයේ පළාත් පාලන ප්‍රතිසංස්කරණ පිළිබඳ පරීක්ෂණ කොමිෂන් සභා වාර්තාවේ (1999 අංක 1 දරණ සැසි වාර්තාව) පළාත් පාලන ආයතන සංස්ථාපනයට අදාල තොරතුරු පිළිබඳව කමිටුව පුළුල් අධ්‍යයනයක යෙදුනු අතර එහිදී එම පරීක්ෂණ කොමිෂන් සභා වාර්තාව මගින් පළාත් පාලන ආයතන සංස්ථාපනය සම්බන්ධව ජාතික නිර්ණායක සකස් කිරීමේදී ජනගහණය හා ජනගහණ ඝනත්වය, නිවාස ප්‍රමාණය හා නිවාස වල ඝණත්වය, සේවා හා යටිතල පහසුකම් වල දියුණුව (ජලය, මාර්ග, විදුලිය, දුරකථන ආදිය), පවතින වාණිජ ගොඩනැගිලි සංඛ්‍යාව, කෘෂිකර්ම නොවන ආර්ථික කටයුතුවල යෙදී සිටින ජනගහණ ප්‍රතිශතය, ප්‍රාදේශීය ආර්ථික ව්‍යුහය හා සම්පත් විභජනය, ප්‍රදේශීය ලෙස ඇති වැදගත්කම හා ස්වභාවික සීමා කෙරෙහි මූලික අවධානය යොමු කළ යුතු බව නිර්දේශ කර ඇති බව කමිටුව විසින් නිරීක්ෂණය කරන ලදී.

තවද කමිටු සාමාජිකයකු ලෙස ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේ නියෝජිතයා විසින් ඉදිරිපත් කරන ලද එම දෙපාර්තමේන්තුව වාර්ෂිකව යාවත්කාලීන කරනු ලබන තොරතුරු හා දත්ත මත මෙම නිර්ණායක ගණනය කිරීමේ කාර්ය පදනම් විය යුතු බව කමිටුව විසින් නිරීක්ෂණය කරන ලදී. මේ සම්බන්ධව ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කළ දත්ත තෝරා ගැනීම හා බර තැබීම පිළිබඳ විශ්ලේෂණාත්මක වාර්තාව අංක 01 වගුවෙන් මෙම වාර්තාවෙහි ඇතුලත් කොට ඇත.

මීට අමතරව කමිටු සාමාජිකයින් විසින් ඉදිරිපත් කරන ලද සියලු කාරණා සමාලෝචනයට භාජනය වූ අතර 1999 වර්ෂයේ පළාත් පාලන ප්‍රතිසංස්කරණ පිළිබඳ පරීක්ෂණ කොමිෂන් සභා වාර්තාවේ නිර්දේශිත යථෝක්ත කාරණා වලට අමතරව ප්‍රදේශයේ ආදායම් විභජනය කෙරෙහිද සැලකිලිමත් විය යුතු බව කමිටුව විසින් තීරණය කරන ලදී.

## 06. පසුබිම

ශ්‍රී ලංකාවේ පළාත් පාලනයට පුරාතන හා මධ්‍යතන යුග දක්වා දිවයන දීර්ඝ ඉතිහාසයක් පැවතියත් මෙරට නූතන පළාත් පාලනය ආරම්භ වන්නේ 19 සියවසේ මැද භාගයේදී බ්‍රිතාන්‍ය යටත් විජිත පාලනය තුළිනි. 1856 සිට කුඩා පරිමාණයේ පළාත් පාලන ආයතන බිහිවෙමින් වර්ධනය වූ දේශීය පළාත් පාලනය 1865 අංක 17 දරණ මහා නගර සභා ආඥාපනත යටතේ කොළඹ මහා නගර සභාව බිහි වීමත් සමඟ මෙරට නූතන පළාත් පාලනයේ සමාරම්භය සනිටුහන් කරනු දැකිය හැකිය.

එතැන් පටන් ක්‍රමානුකූලව වර්ධනය වූ පළාත් පාලන ආයතන පද්ධතිය 20 වන සියවසේ මුල් භාගයේදී යළිත් ප්‍රබල පරිවර්තනයකට යොමු වූයේ 1931 වර්ෂයේ සිට ඩොනමෝර් කොමිෂන් සභා නිර්දේශ ක්‍රියාත්මක වීමත් සමගය. ඒ අනුව පළාත් පරිපාලනය සඳහා විධායක කාරක සභාවක් පත් කිරීම, පළාත් පාලන දෙපාර්තමේන්තුව බිහි වීම, ඒකීය පළාත් පාලන ආයතන පද්ධතිය නිර්මාණය වීම හා පළාත් පාලන සේවාව ආරම්භ වීම යන නව යෝජනා ක්‍රියාත්මක වීමත් සමඟ එහි වර්ධනය වඩාත් වේගවත් විය.

ඒ අනුව නිදහස ලැබීමට පෙර ලංකාවේ පළාත් පාලන ආයතන ව්‍යුහය තාර්කික පදනමකින් යුතුව සංවිධානය වන අයුරු දැකිය හැකිය. ඒ යටතේ ලංකාවේ ඉතා දියුණු නාගරික ලක්ෂණ වලින් හා ජනගහන සනත්වය, ආදායම ආදී කරුණු වලින් ප්‍රමුඛ වූ නගර මහා නගර සභා (Municipal Councils) ලෙසත්, මධ්‍යම ප්‍රමාණයේ නාගරික ලක්ෂණ ඇති නගර, නගර සභා (Urban Councils ලෙසත්, කුඩා නගර සුළු නගර සභා (Town Councils) ලෙසත්, ග්‍රාමීය ප්‍රදේශ ගම් සභා (Village Councils) ලෙසත් වර්ගීකරණය කරන ලදී.

මෙම වර්ගීකරණය සහිත පළාත් පාලන ආයතන ව්‍යුහය 1980 දක්වා දශක පහක පමණ කාලයක් නොවෙනස්ව පැවතුනි. 1980 අංක 35 දරණ දිස්ත්‍රික් සංවර්ධන සභා පනත මගින් දිස්ත්‍රික් සංවර්ධන සභා ඇති කිරීමත් සමඟ එතෙක් පැවති ගම් සභා 549 හා සුළු නගර සභා 83 අහෝසි කරණ ලදී. එම ආයතන සතු පළාත් පාලන කාර්යභාරය දිස්ත්‍රික් සංවර්ධන සභා වෙත පවරන ලදී.

නැවත 1987 දී, එවකට පැවති රජය විසින් දිස්ත්‍රික් සංවර්ධන සභා අහෝසි කොට මුලින් පැවති ගම් සභා සහ සුළු නගර සභා ප්‍රදේශ ඇතුලත් වන පරිදි ප්‍රාදේශීය සභා නමින් නව පළාත් පාලන ආයතනයක් 1987-04-16 දින සිට බලපවත්වන පරිදි ඇති කරන ලදී. ඒ අනුව 1987 දී පැවති පළාත් පාලන ආයතන ව්‍යුහය මෙසේය.

| | | |
|---|---|---|
| 1. | මහා නගර සභා | 12 |
| 2. | නගර සභා | 39 |
| 3. | ප්‍රාදේශීය සභා | 251 |
| | | 302 |

මෙසේ ආයතන තෙවර්ගයකින් සමන්විත වූ පළාත් පාලන ව්‍යුහය මේ දක්වා නොවෙනස්ව පවතී.

කෙසේ වෙතත්, ශ්‍රී ලංකාවේ සිදුවූ මෑත කාලීන සමාජ, ආර්ථික හා දේශපාලනික වෙනස්කම් හේතු කොට ගෙන නව මහා නගර සභා, නගර සභා සහ ප්‍රාදේශීය සභා ඇති කිරීම පිණිස ඉල්ලීම් රාශියක් ඉදිරිපත් වූ අතර ඒ අනුව නව පළාත් පාලන ආයතන ගණනාවක් ඇති කරන ලදී.

මේ වන විට (2017) ශ්‍රී ලංකාවේ පවතින පළාත් පාලන ආයතන සංඛ්‍යාව මෙසේය.

| | | |
|---|---|---|
| 1. | මහා නගර සභා | 23 |
| 2. | නගර සභා | 41 |
| 3. | ප්‍රාදේශීය සභා | 271 |
| | | 335 |

## 07. පළාත් පාලන ආයතන සංස්ථාපනයට අදාල නෛතික විධිවිධාන

පළාත් පාලන ආයතන සංස්ථාපනය කිරීමේ බලය 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 9 වන උප ලේඛණයේ I වන ලැයිස්තුවේ 4.1 ඡේදය ප්‍රකාර ව රජය වෙත පැවරේ. එම බලය පාර්ලිමේන්තුව විසින් සම්මත කරණ ලද නීති ප්‍රකාර, පාලන ව්‍යවස්ථා මගින් පළාත් පාලන විෂය භාර රේඛීය අමාත්‍යාංශයේ අමාත්‍යවරයා වෙත පැවරී ඇත.

### i. ප්‍රාදේශීය සභා

2 වන වගන්තියේ (1) වන උප වගන්තිය;

"අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළකරනු ලබන නියමයක් මගින්, යම් ප්‍රදේශයක් මේ පනතේ කාර්යයන් සඳහා ප්‍රාදේශීය සභා ප්‍රදේශයක් විය යුතු යැයි ප්‍රකාශ කර, එසේ ප්‍රකාශ කරන ලද ප්‍රදේශයේ පරිපාලන සීමා නිශ්චය කරනු ලැබිය හැකිය. එසේ ප්‍රකාශයට පත් කරනු ලැබූ සෑම ප්‍රාදේශීය සභාවකම පරිපාලන සීමා, හැකිතාක් දුරට උප දිසාපති වරයෙකුගේ කොට්ඨාශය තුළට වැටෙන නාගරිකයකින් හෝ (නගර සභා ආඥා පනතේ අර්ථානුකූලව) නගරයකින් හෝ සමන්විත ප්‍රදේශ හැර උප දිසාපතිවරයෙකුගේ කොට්ඨාශයෙහි සීමාවන්ට අනුරූප විය යුතුය "

මෙම විධිවිධාන ප්‍රකාර ශ්‍රී ලංකාවේ නව ප්‍රාදේශීය සභාවක් සංස්ථාපනය කරන විට මූලික වශයෙන් සොයා බැලිය යුතු නිර්ණායකය ලෙස නීතියෙහි දැක්වෙන්නේ එම ප්‍රදේශය උප දිසාපතිවරයකුගේ (ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය) බල ප්‍රදේශයක සීමාවන්ට සමපාත විය යුතු බවයි.

### ii. නගර සභා

2 වන වගනතියේ (1) වන උපවගන්තිය:

"අමාත්‍යවරයා විසින්, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මඟින්, ප්‍රදේශයේ සංවර්ධනය හෝ එහි ඇති පහසුකම් අනුව නාගරික ස්වභාවයක් දරන යම් ප්‍රදේශයක් මේ ආඥාපනතේ කාර්යයන් සඳහා නගරයක් ලෙස ප්‍රකාශයට පත් කරනු ලැබිය හැකි අතර එසේ ප්‍රකාශයට පත් කරන ලද නගරයේ පරිපාලන සීමා නියම කළ හැකිය."

ඉහත විධි විධාන අනුව පෙනී යන්නේ අදාල ප්‍රදේශයේ සංවර්ධනය හෝ එහි ඇති පහසුකම් අනුව නාගරික ස්වභාවයක් දරන යම් ප්‍රදේශයක් නගර සභාවක් ලෙස සංස්ථාපනයට සුදුසුකම් ලබන බවයි.

**iii.** මහා නගර සභා

මහා නගර සභා ආඥාපනතේ 2 වන වගන්තිය ප්‍රකාර "ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින්, අමාත්‍යවරයාට ;

(අ) යම් ප්‍රදේශයක් මහා නගරයක් ලෙස ප්‍රකාශයට පත් කළ හැකිය.

(ආ) එසේ ප්‍රකාශයට පත් කරනු ලැබූ මහා නගරයේ සීමා නිශ්චය කළ හැකිය. "

මෙහි දැකිය හැකි විශේෂත්වය වන්නේ මහා නගරයක් සංස්ථාපනය කිරීමට පූර්වයෙන් එකී ප්‍රදේශයේ පැවතිය යුතු භෞතික තත්වයන් පිළිබඳව නිර්ණායක කිසිවක් මෙම වගන්තියේ සඳහන් නොවීමයි.

එතෙකුදුවුවත්, මහා නගර සභා ආඥාපනතේ 7 වන වගන්තිය ප්‍රකාර මහා නගර සභාවක් සංස්ථාපනයට පූර්වයෙන් වූ වැඩපිළිවෙල අමාත්‍යවරයාට ගැසට් පත්‍රයෙහි පළකරනු ලබන නියමයක් මගින් තීරණය කළ හැකිය.

7 වගන්තිය- "මෙම ආඥාපනත යටතේ යම් මහා නගර සභාවක් සංස්ථාපනය කිරීමට ප්‍රාරම්භක වූ යම් වැඩපිළිවෙලක කාර්යයන් සඳහා ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් හෝ නියමයන් මගින්, අමාත්‍යවරයා විසින්, අවශ්‍ය හෝ යෝග්‍ය වූ සියලු විධාන නිකුත් කිරීම හෝ ඔහු විසින් එකී නියමයෙහි නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි අන්දමට හෝ ප්‍රමාණයකට එම ආඥාපනතේ විධිවිධාන කිසිවක් මද වශයෙන් වෙනස් කිරීම හෝ පරිපූරණය කිරීම නීත්‍යානුකූල වන අතර, එකී සෑම නියමයක් ම මෙම ආඥාපනතෙහි ඇතුළත් කරන ලද්දක් පරිද්දෙන් ඉහත කී කාර්යයන් සම්බන්ධයෙන් බල පවත්වන්නේය. "

මෙම විධිවිධාන මගින් අමාත්‍යවරයාට මහා නගර සභා සංස්ථාපනයට අදාලව නිසි ක්‍රමවේදයක් නීතිගත කිරීමට ඉතා යෝග්‍ය ඉඩ ප්‍රස්ථාවක් සැලසේ.

පළාත් පාලන ආයතන සංස්ථාපනය කිරීමට ඉහත කී නීතිමය විධිවිධාන වලට අමතරව 1999 අංක 1 දරණ සැසි වාර්තාවෙන් ප්‍රකාශයට පත් කරන ලද පළාත් පාලන ප්‍රතිසංස්කරණ පිලිබඳ පරීක්ෂණ කොමිෂන් සභා වාර්ථාවේ නාගරික පළාත් පාලන ආයතන හා ග්‍රාමීය පළාත් පාලන

ආයතන වෙන්ව හඳුනාගැනීම සඳහා අදාල කර ගත හැකි නාගරිකත්වය නිශ්චය කිරීමේ නිර්ණායක ගණනාවක් ඉදිරිපත් කර ඇත.

ඊට අදාල කොමිෂන් සභා නිර්දේශ (ඇමුණුම අංක 02) හි දැක්වේ.

## 08. පළාත් පාලන ආයතන සංස්ථාපනය හා පවතින ආයතන උත්ශ්‍රේණිගත කිරීමේ දී වර්තමානයේ දී අනුගමනය කරනු ලබන කාර්ය පරිපාටිය:

කමිටුව විසින් මෙම කරුණට අදාලව දැනට අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරනු ලබන ක්‍රියා පරිපාටිය පිළිබඳව අවධානය යොමු කරන ලදී. එය ආරම්භය වන්නේ කිසියම් දේශපාලන හෝ පරිපාලන බලධරයෙකුගෙන් අමාත්‍යවරයා වෙත ලැබෙන ඉල්ලීමක් මත වූ යෝජනාවක් පාදක කොට ගෙන අමාත්‍යාංශය විසින් අදාල පළාතේ ප්‍රධාන ලේකම්වරයාගේ නිරීක්ෂණ ලබාගෙන ඒ සඳහා සවිස්තර අධ්‍යයනයක් කිරීම සඳහා ප්‍රධාන ලේකම් වෙතින් නිලධාරී කමිටුවක් සඳහා නාම යෝජනා ලබා ගැනීමෙනි. ඒ අනුව ප්‍රධාන ලේකම්වරයා විසින් ඉදිරිපත් කරනු ලබන නිළධාරීන්ගෙන් සමන්විත කමිටුවක් ඇමතිවරයා විසින් පත් කරනු ලැබේ. ඊට පළාතේ පළාත් පාලන විෂය පිළිබඳව ප්‍රවීණතාවයක් ඇති ජ්‍යෙෂ්ඨ නිළධාරියෙකු, අදාල දිස්ත්‍රික්කයේ පළාත් පාලන සහකාර කොමසරිස්වරයා සහ දිස්ත්‍රික් මැණුම් අධිකාරිවරයා අයත් වේ. මෙම නිළධාරී කමිටුව විසින් පුවත් පත් දැන්වීම මගින් ත්‍රෛභාෂාමය දැනුම් දීමක් කර මහජන අදහස් ලබා ගැනීමටත් සෙසු වැදගත් පුද්ගලයන්ගෙන්, ආයතනවලින් හා ප්‍රභූන්ගෙන් අදහස් ලිඛිතව හා වාචිකව අදහස් ලබා ගැනීමටත් ක්‍රියා කෙරේ.

අමාත්‍යාංශය මගින් කමිටුව වෙත ලබා දෙන ලිඛිත මග පෙන්වීම ප්‍රකාර අදාල කමිටු වාර්තාව සම්පාදනය කළ යුතුවේ. අමාත්‍යාංශයෙන් කමිටුව වෙත යොමු කරන මග පෙන්වීම ලිපියේ ආදර්ශයක් (ඇමුණුම අංක 03) හි දක්වා ඇත.

අදාල වාර්තාව ඉදිරිපත් කිරීමට සාමාන්‍යයෙන් මාස 3 ක කාල සීමාවක් ලබා දෙනු ලැබේ.

එම වාර්තාව ලද පසුව එහි නිර්දේශ පිලිබඳව ලේකම් විසින් කරුණු සලකා බලා එහිලා පවතින තත්ත්වය අමාත්‍යවරයා වෙත වාර්තා කෙරේ. එම වාර්තාවෙහි අදාල ආයතන ඇති කිරීම පිළිබඳ නිර්දේශ, අවාසි තිබේනම් එම කරුණු, විකල්ප යෝජනා ආදිය ඇතුලත් වේ. ඒ අනුව අමාත්‍යවරයාට පනතේ සඳහන් සිය බලතල ප්‍රකාර සුදුසු තීරණයක් ගැනීමට අවකාශ සැලසේ.

කෙසේ වෙතත් මේ කාරණය සඳහා පළ කළ යුතු පුවත්පත් දැන්වීම් හා කමිටු සාමාජිකයන්ගේ පාරිශ්‍රමික අමාත්‍යාංශය මගින් දැරිය යුතුවේ.

මේ අනුව එක් ආයතනයක් සම්බන්ධව නිර්දේශ ඇතුළත් වාර්තාවක් ලබා ගැනීම සඳහා සාමාන්‍යයෙන් මාස 6 සිට වසර 10 දක්වා කාලය ගත වන බව ලැබී ඇති වාර්තාව පරීක්ෂා කිරීමේදී පෙනී යයි.

**අමාත්‍යාංශය වෙත පළාත් පාලන ආයතන සංස්ථාපනය සඳහා ලැබී ඇති යෝජනා**

2016-12-31 වන විට නව පළාත් පාලන ආයතන සංස්ථාපනය කිරීම සහ පවතින පළාත් පාලන ආයතන උත්ශ්‍රේණිගත කිරීමට යෝජනා 57 ක් ලැබී ඇත. ඒ අනුව,

1. බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයෙන් ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටෙ මහා නගර සභාවේ සීමා පුළුල් කිරීම, මහරගම මහා නගර සභාව සංස්ථාපනය කිරීම, හෝමාගම නව ප්‍රාදේශීය සභාව සංස්ථාපනය කිරීම සහ පාදුක්ක ප්‍රාදේශීය සභාව සංස්ථාපනය කිරීම සඳහා ඉල්ලීම් හතරක් ද,

2. ගම්පහ දිස්ත්‍රික්කයේ පෑලියගොඩ නගර සභාව සහ කැලණිය ප්‍රාදේශීය සභාව ඒකාබද්ධ කර මහා නගර සභාවක් සංස්ථාපනය කිරීම සඳහා ඉල්ලීමක්ද

3. කළුතර දිස්ත්‍රික්කයේ කළුතර මහා නගර සභාව සංස්ථාපනය කිරීම, දර්ගා නගරය නගර සභාවක් බවට උසස් කිරීම, හොරණ නගර සභාවේ සීමා පුළුල් කිරීම සහ ඉංගිරිය නව ප්‍රාදේශීය සභාව සංස්ථාපනය කිරීම සඳහා ඉල්ලීම් හතරක්ද,

4. මහනුවර දිස්ත්‍රික්කයේ දෙල්තොට නව ප්‍රාදේශීය සභාව සංස්ථාපනය කිරීම, හතරලියද්ද ප්‍රාදේශීය සභාව සංස්ථාපනය කිරීම සහ පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාවේ නම නාවලපිටිය ප්‍රාදේශීය සභාව ලෙස වෙනස් කිරීම සඳහා ඉල්ලීම් තුනක්ද,

5. මාතලේ දිස්ත්‍රික්කයේ මාතලේ මහා නගර සභාවේ සීමා පුළුල් කිරීම සඳහා ඉල්ලීමක්ද,

6. ගාල්ල දිස්ත්‍රික්කයේ හික්කඩුව නගර සභාවේ සීමා ව පුලුල් කිරීම, ගෝනාපීනුවල නව ප්‍රාදේශීය සභාව සංස්ථාපනය කිරීම, බලපිටිය ප්‍රාදේශීය සභාව නගර සභාවක් බවට උසස් කිරීම සහ අම්බලන්ගොඩ ප්‍රාදේශීය සභාවේ සීමාව පුලුල් කිරීම සඳහා ඉල්ලීම් 04 ක්ද;

7. මාතර දිස්ත්‍රික්කයේ කොටපොල ප්‍රාදේශීය සභාවේ නම දෙනියාය ප්‍රාදේශීය සභාව ලෙස වෙනස් කිරීම සහ වැලිවිටිය නව ප්‍රාදේශීය සභාව සංස්ථාපනය කිරීම සඳහා ඉල්ලීම් 02 ක්ද;

8. හම්බන්තොට දිස්ත්‍රික්කයේ ඕකේවෙල ප්‍රාදේශීය සභාව සංස්ථාපනය කිරීම සහ වලස්මුල්ල ප්‍රාදේශීය සභාව සංස්ථාපනය කිරීම සඳහා ඉල්ලීම් 02 ක්ද;

9. කුරුණෑගල දිස්ත්‍රික්කයේ කුරුණෑගල මහා නගර සභාවේ සීමා සංශෝධනය කිරීම, කුලියාපිටිය මහා නගර සභාවක් සංස්ථාපනය කිරීම, මල්ලවපිටිය නව ප්‍රාදේශීය සභාව සංස්ථාපනය කිරීම, බමුණාකොටුව ප්‍රාදේශීය සභාව සංස්ථාපනය කිරීම, ඇහැටුවැව ප්‍රාදේශීය සභාව සංස්ථාපනය කිරීම සහ පඩුවස්නුවර නැගෙනහිර ප්‍රාදේශීය සභාව සංස්ථාපනය කිරීම සඳහා ඉල්ලීම් 06 ක්ද;

10. පුත්තලම දිස්ත්‍රිකකයේ පුත්තලම මහා නගර සභාව සංස්ථාපනය කිරීම, මහවැව ප්‍රාදේශීය සභාව සංස්ථාපනය කිරීම, හලාවත නගර සභාව මහා නගර සභාවක් බවට උසස් කිරීම, පල්ලම ප්‍රාදේශීය සභාව සංස්ථාපනය කිරීම (ආඩිගම නව ප්‍රාදේශීය සභාව සංස්ථාපනය කිරීම) මහකුඹුක්කඩවල ප්‍රාදේශීය සභාව සංස්ථාපනය කිරීම සහ දන්කොටුව ප්‍රාදේශීය සභාව සංස්ථාපනය කිරීම සඳහා ඉල්ලීම් 06 ක්ද;

11. බදුල්ල දිස්ත්‍රික්කයේ වැලිමඩ නගර සභාව සංස්ථාපනය කිරීම, මහියංගනය නගර සභාව සංස්ථාපනය කිරීම, හපුතලේ නගර සභාවේ සීමා පුලුල් කිරීම, මොණරාගල නගර සභාව සංස්ථාපනය කිරීම සහ සෙවනගල ප්‍රාදේශීය සභාව සංස්ථාපනය කිරීම සඳහා ඉල්ලීම් 05 ක්ද;

12. රත්නපුර දිස්ත්‍රික්කයේ කහවත්ත සහ ගොඩකවෙල ප්‍රාදේශීය සභාවල සීමා සංශෝධනය, කිරිඇල්ල නව ප්‍රාදේශීය සභාව සංස්ථාපනය කිරීම සහ ඇලපාත නව ප්‍රාදේශීය සභාව සංස්ථාපනය කිරීම සඳහා ඉල්ලීම් 03 ක්ද;

13. අනුරාධපුර දිස්ත්‍රික්කයේ විලච්චිය ප්‍රාදේශීය සභාව සංස්ථාපනය කිරීම සහ කඹුත්තේගම නව ප්‍රාද්ශීය සභාව සංස්ථාපනය කිරීම සඳහා ඉල්ලීම් 02 ක්ද;

14. මඩකලපුව දිස්ත්‍රික්කයේ කෝරළෙපත්තු මධ්‍යම නගර සභාව සංස්ථාපනය කිරීම, කෝරළෙපත්තු දකුණ ප්‍රාදේශීය සභාව සංස්ථාපනය කිරීම සහ කාතන්කුඩි නගර සභාව බෙදා මහා නගර සභාවක් සහ ප්‍රාදේශීය සභාවක් සංස්ථාපනය කිරීම සඳහා ඉල්ලීම් 03 ක්ද;

15. නැගෙනහිර පළාතේ ත්‍රිකුණාමලය මහා නගර සභාව සංස්ථාපනය කිරීම සඳහා ද,

16. අම්පාර දිස්ත්‍රික්කයේ සයින්දමරුදු නව ප්‍රාදේශීය සභාව සංස්ථාපනය කිරීම, සමන්තුරෙයි නව නගර සභාව සංස්ථාපනය කිරීම සහ අම්පාර මහා නගර සභාව සංස්ථාපනය කිරීම සඳහා ඉල්ලීම් 03 ක්ද;

17. යාපනය දිස්ත්‍රික්කයේ නව නගර සභා සංස්ථාපනය කිරීම, මරුදන්කර්නි නව ප්‍රාදේශීය සභාව සංස්ථාපනය කිරීම, මඩු ප්‍රාදේශීය සභාව සංස්ථාපනය කිරීම, වැලිඔය ප්‍රාදේශීය සභාව සංස්ථාපනය කිරීම, ඔඩ්ඩුසුඩාන් ප්‍රාදේශීය සභාව සංස්ථාපනය කිරීම, කරච්චි උතුර නව ප්‍රාදේශීය සභාව සංස්ථාපනය කිරීම සහ වවුනියා නගර සභාව මහා නගර සභාවක් බවට උසස් කිරීම සඳහා ඉල්ලීම් 07 ක්ද ලැබී තිබේ.

මීට අමතරව අඹගමුව ප්‍රාදේශීය සභාව නුවරඑළිය ප්‍රාදේශීය සභාව විශාල ජනගහනයක් හා භූමි ප්‍රමාණයක් තුල පිහිටි ප්‍රාදේශීය සභා ලෙස සංස්ථාපනය වී ඇතත් එම ආයතන තුළ නව ආයතන නිර්මාණය කිරීම උදෙසා අමාත්‍යාංශය වෙත කිසිදු ලිඛිත ඉල්ලීමක් මේ වන තෙක් ලැබී නැත.

## 09.කමිටුවේ නිර්දේශ

කමිටුව විසින් මෙම විෂයට අදාල සියළු කරුණු විමසුමට ලක් කරන ලද අතර ඒ අනුව නව පළාත් පාලන ආයතන සංස්ථාපනය කිරීමේ දී හා පවතින පළාත් පාලන ආයතන උත්ශ්‍රේණිගත කිරීමේ දී අනුගමනය කළ යුතු යැයි කමිටුව අදහස් කරන නිර්දේශ මෙසේ ඉදිරිපත් කරමු.

### (i). යෝජනා සළකා බැලීම සඳහා කමිටුවක් පිහිටුවීම

1.1පළාත් පාලන ආයතනයක් සංස්ථාපනය සඳහා යෝජනාවක් ලද පසු එම යෝජනාව අයත් වන පළාත් සභාවේ ප්‍රධාන ලේකම් වෙතින් පූර්වෝක්ත කරුණු සවිස්තරව සලකා බලා වැඩිදුර නිර්දේශ ලබා ගැනීම පිණිසනිළධාරි කමිටුවක් පත් කිරීමට නාම යෝජනා ලබා ගතයුතු අතරමෙම කමිටුවට අදාල පළාතේ පළාත් පාලන විෂය පිළිබඳ ප්‍රවීණත්වයක් ඇති අමාත්‍යාංශ ලේකම්වරයෙකු, අදාල දිස්ත්‍රික්කයේ පළාත් පාලන සහකාර කොමසාරිස්වරයා දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මැනුම් අධිකාරීවරයා, දිස්ත්‍රික් සංඛ්‍යාලේඛනඥ සහ ප්‍රධාන ලේකම් තීරණය කරන වෙනත් නිලධාරියෙකු පත් කිරීම සුදුසු බව නිර්දේශ කරමු. එසේම එම කමිටුවේ කාර්යය භාරය ලෙස මෙම වාර්තාවේ වගුව 1 ලෙස දක්වා ඇති සංඛ්‍යා ලේඛන පදනම් කර ගෙන මුලික නිර්ණායක වලට අදාළ තොරතුරු සම්පාදනය කර ඊට අදාළ බර තැබීම් අනුව ලකුණු ලබා දී සම්පූර්ණ ලකුණු ලැයිස්තුවක් පිළියෙල කළ යුතුවේ.

1.2ඉහතකීකමිටුවටමහජනඅදහස්ලබාගැනීම,වාචිකව සාක්ෂි ලබා ගැනීම අදාල ක්ෂේත්‍රයේ විශේෂඥයින් හා ප්‍රභූන්ගෙන් අදහස් ලබා ගැනීම පිණිස භාෂාත්‍රයෙන්ම යටත් පිරිසයෙන් ප්‍රමුඛ පුවත්පත් තුනකවත් පැහැදිලිව දැන්වීම් පළකිරීමට විධිවිධාන සැලැස්වීම සුදුසු යැයි නිර්දේශ කරමු.

(ii)මූලික නිර්ණායක

නව පළාත් පාලන ආයතනයන් සංස්ථාපනය කිරීමේ දී සහ පවතින පළාත් පාලන ආයතනයක් උත්ශ්‍රේණිගත කිරීමේ දී පහත සඳහන් මූලික කරුණු නිර්නායක ලෙස පිළිගත යුතු බව කමිටුව නිර්දේශ කරයි.

i. ජන සංඛ්‍යාව හා ජන ඝනත්වය
ii. නිවාස ප්‍රමාණය හා ඝණත්වය
iii. සේවා සම්පාදනය හා යටිතල පහසුකම්වල දියුණුව
iv. වාණිජ හා කර්මාන්ත ආයතනවල ව්‍යාප්තිය
v. සේවා නියුක්තිය
vi. යෝජිත ආයතනයේ බලප්‍රදේශයේ ස්වයං ජනිත ආදායම

(iii).නිර්ණායක සඳහා දත්ත සපයා ගැනීම

ඉහත නිර්ණායක සඳහා අවශ්‍ය දත්ත හා තොරතුරු ජන හා සංඛ්‍යා ලේඛණ දෙපාර්තමේන්තුව විසින් වාර්ෂිකව යාවත්කාලීන කරමින් ප්‍රසිද්ධ කරනු ලබන වාර්ෂික සංඛ්‍යාලේඛන දත්ත වාර්තා මගින් ලබා ගැනීම නිර්දේශ කෙරේ. පළාත් පාලන ආයතනයේ ආදායම් දත්ත මෙම අමාත්‍යාංශයේ වියදම් විමංසන අංශයෙන් වාර්ෂිකව නිකුත් කරන වාර්තාවෙන් ලබා ගැනීම සුදුසුය.

(iv).දත්තසඳහාබරතැබීම

ශ්‍රී ලංකාවේ ඒ ඒ පළාත් පාලන ආයතන බලප්‍රදේශ වල පවතින දේශගුණික , භූගෝලීය, ආර්ථික සාධක අනුව ඒ ඒ නිර්ණායක සඳහා බර තැබීමේ ක්‍රමයක් ක්‍රියාත්මක විය යුතු බවකමිටුව නිර්දේශ කරයි. ඒ අනුව මුළු ලකුණු 100 ක්එක් එක් නිර්ණායක වල වැදගත්කම මතබෙදා වෙන් කිරීමටත් එසේ බෙදා වෙන් කරන ලද බර තැබීම පහත සඳහන් පරිදි විය යුතු බවටත් නිර්දේශ කෙරේ. මේ පිළිබඳ සවිස්තර තොරතුරු පහත සඳහන් අංක 1 වගුවේ දැක්වේ

(66)

## අංක 01 වගුව

**පලාත් පාලන ආයතනයේ ස්වභාවය සහ මූලික නිර්ණායකය යටතේ තෝරාගත් සංවර්ධන දර්ශකය අනුව ලබා ගත යුතු අවම ලකුණු කඩඉම් සීමාව හා පොදු බර තැබීම.**

| මූලික නිර්ණායකය හා සංවර්ධන දර්ශකය | | මිණුම් ඒකකය | පලාත් පාලන ආයතනයේ ස්වභාවය හා කඩඉම් සීමාව | | | බර තැබීම |
|---|---|---|---|---|---|---|
| | | | මහනගර සභා | නගර සභා | ප්‍රාදේශීය සභා | |
| i | ජන සංඛ්‍යාව හා ජන ඝනත්වය | | | | | **20.0** |
| | ජනගහන ප්‍රමාණය | ගණන | 65000 | 25000 | 50000 | 10.0 |
| | ජනගහන ඝනත්වය | වර්ග කි. මී. ට ගණන | 3000 | 2000 | 350 | 10.0 |
| ii | නිවාස ප්‍රමාණය හා ඝණත්වය | | | | | **16.0** |
| | නිවාස ඒකක ප්‍රමාණය | ගණන | 16000 | 6000 | 12500 | 7.0 |
| | නිවාස ඝනත්වය | වර්ග කි. මී. යට ගණන | 750 | 500 | 85 | 7.0 |
| | ස්ථිර නිවාස ඒකක | නිවාස ඒකක ප්‍රතිශතය | 90.0 | 85.0 | 80.0 | 1.0 |
| | නිවාස ඒකකයේ අයිතිය | පදිංචි කරුට හිමි ඒකක ප්‍රතිශතය | 85.0 | 80.0 | 90.0 | 1.0 |
| iii | සේවා සම්පාදනය හා යටිතල පහසුකම්වල දියුණුව | | | | | **14.0** |
| | විදුලිය | නිවාස ඒකක ප්‍රතිශතය | 95.0 | 90.0 | 85.0 | 0.5 |
| | ජලය | නිවාස ඒකක ප්‍රතිශතය | 75.0 | 50.0 | 10.0 | 1.0 |
| | දුරකථන පහසුකම් - ගෘහස්ථ | නිවාස ඒකක ප්‍රතිශතය | 50.0 | 40.0 | 40.0 | 0.5 |
| | දුරකථන පහසුකම් - ජංගම | නිවාස ඒකක ප්‍රතිශතය | 85.0 | 80.0 | 75.0 | 0.5 |
| | ඝන අපද්‍රව්‍ය ගෙන බැහැර කිරීම | නිවාස ඒකක ප්‍රතිශතය | 50.0 | 25.0 | 3.0 | 0.5 |
| | ගෑස් භාවිතය (ආහාර පිසීමට) | නිවාස ඒකක ප්‍රතිශතය | 40.0 | 25.0 | 5.0 | 0.5 |
| | ජල-මුද්‍රිත වැසිකිලි පහසුකම් | නිවාස ඒකක ප්‍රතිශතය | 95.0 | 95.0 | 90.0 | 0.5 |
| | මගී බස්රථ ආරම්භය/ අවසානය | ග්‍රා. නි. වසම් ප්‍රතිශතය | 75.0 | 75.0 | 40.0 | 0.5 |
| | දුම්රිය මගී නැවතුම | ග්‍රා. නි. වසම් ප්‍රතිශතය | 50.0 | 40.0 | - | 0.5 |
| | ප්‍රධාන මාර්ගය | ග්‍රා. නි. වසම් ප්‍රතිශතය | 100.0 | 90.0 | 90.0 | 0.5 |
| | පොදු පහසුකම් සහිත නගරය | ග්‍රා. නි. වසම් ප්‍රතිශතය | 90.0 | 80.0 | 50.0 | 0.5 |
| | ආරෝග්‍ය ශාලාව | ග්‍රා. නි. වසම් ප්‍රතිශතය | 65.0 | 60.0 | 20.0 | 0.5 |
| | ඩිස්පැන්සරිය | ග්‍රා. නි. වසම් ප්‍රතිශතය | 85.0 | 75.0 | 40.0 | 0.5 |
| | මාතෘ/ ළමා සායනය | ග්‍රා. නි. වසම් ප්‍රතිශතය | 85.0 | 75.0 | 60.0 | 0.5 |
| | උසස් පාසල | ග්‍රා. නි. වසම් ප්‍රතිශතය | 85.0 | 75.0 | 40.0 | 0.5 |
| | පාසල | ග්‍රා. නි. වසම් ප්‍රතිශතය | 90.0 | 90.0 | 75.0 | 0.5 |
| | ළදරු අධ්‍යාපන ඒකකය | ග්‍රා. නි. වසම් ප්‍රතිශතය | 100.0 | 95.0 | 90.0 | 0.5 |
| | තැපැල් කාර්යාලය | ග්‍රා. නි. වසම් ප්‍රතිශතය | 90.0 | 80.0 | 65.0 | 0.5 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | භාහිර තො. ස. පහසුකම් | ග්‍රා. නි. වසම් ප්‍රතිශතය | 90.0 | 80.0 | 40.0 | 0.5 |
| | බැංකුව | ග්‍රා. නි. වසම් ප්‍රතිශතය | 80.0 | 70.0 | 40.0 | 0.5 |
| | ක්‍රීඩාංගනය | ග්‍රා. නි. වසම් ප්‍රතිශතය | 85.0 | 75.0 | 65.0 | 0.5 |
| | පුස්තකාලය | ග්‍රා. නි. වසම් ප්‍රතිශතය | 75.0 | 70.0 | 30.0 | 0.5 |
| | සුසාන භූමිය | ග්‍රා. නි. වසම් ප්‍රතිශතය | 75.0 | 75.0 | 85.0 | 0.5 |
| | ඉන්ධන පිරවුම් හල | ග්‍රා. නි. වසම් ප්‍රතිශතය | 75.0 | 75.0 | 15.0 | 0.5 |
| | පොලිස් ස්ථානය | ග්‍රා. නි. වසම් ප්‍රතිශතය | 60.0 | 50.0 | 15.0 | 0.5 |
| | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | ග්‍රා. නි. වසම් ප්‍රතිශතය | 50.0 | 40.0 | 10.0 | 0.5 |
| | පලාත් පාලන කාර්යාලය | ග්‍රා. නි. වසම් ප්‍රතිශතය | 50.0 | 40.0 | 15.0 | 0.5 |
| iv | වාණිජ හා කර්මාන්ත ආයතන ව්‍යාප්තිය | | | | 15.0 | |
| | කුඩා (සේවකයින් 5ට අඩු) | ගණන | 3000 | 1200 | 1500 | 5.0 |
| | මධ්‍යම (සේවකයින් 5-24) | ගණන | 400 | 100 | 75 | 5.0 |
| | විශාල (සේවකයින් 24ට වැඩි) | ගණන | 100 | 25 | 15 | 5.0 |
| v | සේවා නියුක්තිය | | | | 16.0 | |
| | රැකියා නියුක්තිය | ගණන | 20000 | 7500 | 18000 | 3.0 |
| | කෘෂිකාර්මික නොවන රැකියා | නියුක්ත ප්‍රතිශතය | 90.0 | 80.0 | 60.0 | 6.0 |
| | සේවා යෝජකයින් | ප්‍රතිශතය | 4.0 | 3.5 | 1.5 | 3.0 |
| | සේවකයින් | ප්‍රතිශතය | 65.0 | 60.0 | 50.0 | 3.0 |
| vi | යෝජිත ආයතනයේ බලප්‍රදේශයේ ස්වයං ජනිත ආදායම | | | | | 20.0 |
| | වාර්ෂික ආදායම (අධාරමය නොවන) | රු. මිලියන | 175 | 50 | 20 | 20.0 |
| | එකතුව | | | | | 100 |

සටහන- ඉහත ග්‍රා. නි. වසම් ප්‍රතිශතය ලෙස සලකනු ලබන්නේ සලකා බලනු ලබන පලාත් පාලන ආයතනය තුල ඇති ග්‍රාම නිලධාරී වසම් අතුරින් අදාල පහසුකම ග්‍රා. නි. වසම තුල හෝ ග්‍රා. නි. වසමේ සිට කි. මී. 2 ක් තුලදී සපුරා ගත හැකි ග්‍රාම නිලධාරී වසම් ප්‍රතිශතය වේ.

**(v).** යම් පළාත් පාලන ආයතනයක් සංස්ථාපනය කිරීමේදී දැනටමත් තිබෙන ඉඩම්, ගොඩනැගිලි, යන්ත්‍රෝපකරණ හා කාර්යය මණ්ඩල යන පහසුකම් සළසා ගත නොහැකි අවස්ථාක් පවතී නම් නව පළාත් පාලන ආයතනයක් සංස්ථාපනය කිරීමේදී රජයට වැය බරක් දැරීමට සිදු විය හැකිය. එම වැය බර කොපමණද යන්න පිළිබඳව පුරෝකතනයක් ලබා තිබීම අත්‍යාවශ්‍ය වේ. එම නිසා නව පළාත් පාලන ආයතනයක් සංස්ථාපනය කිරීමේදී ඊට අවශ්‍ය විය හැකි ඉඩම්, ගොඩනැගිලි, යන්ත්‍රෝපකරණ, ලී බඩු උපකරණ නව කාර්යය මණ්ඩල යනාදි සියලුම කාරනා සඳහා වැය වේ යැයි අපේක්ෂා කරන මුදලක් ඇස්තමේන්තු කිරීම සුදුසු යැයි කමිටුව නිර්දේශ කරයි.

## (vii). නව පළාත් පාලන ආයතන නිර්මාණය කිරීමට පදනම් කර ගත යුතු ලකුණු ප්‍රමාණය

6.1. ඉහත අංක 1 දරණ වගුවට ඇතුලත් වී ඇති අංක 1 සිට 6 දක්වා වූ නිර්ණායක සඳහා 80%ක ලකුණු ප්‍රතිශතයක් ලබා ගන්නා ආයතනය අමාත්‍යවරයා විසින් නව පළාත් පාලන ආයතනයක් ලෙස සංස්ථාපනය කිරීම මැනවැයි කමිටුව නිර්දේශ කරයි.

6.2. එසේ වුවද යම් පළාත් පාලන ආයතනයක් 70% ක උපරිම ලකුණු ප්‍රතිශතයක් ලබා ගෙන ඇති විටක එම ආයතනය සංස්ථාපනය කිරීමට යම් සුවිශේෂ කරුණු ඇතැයි අමාත්‍යවරයා කල්පනා කරන්නේ නම් ඉහත 1 ඡේදයේ දක්වා ඇති 80% ලකුණු ප්‍රතිශතයක් ලබා ගැනීමේ අවශ්‍යතාවය සංශෝධනය කිරීම පිළිබඳව කමිටුව විරුද්ධ නොවේ. එහෙත් එවැනි අවස්ථාවක 70% ට වඩා අඩු ලකුණු ප්‍රතිශතයක් ලබා ගත් පළාත් පාලන ආයතනයක් කුමන අවස්ථාගත කරුණකදී හෝ සංස්ථාපනය කිරීම කමිටුව නිර්දේශ නොකරයි.

01. ..................................................

නිතිඥ චන්දක ජයසුන්දර

කමිටු සභාපති

02 ..................................................

එස්.ඩී.ජ්.බී.බොරලැස්ස

කමිටු ලේකම්

03. ..................................................

ඩී.පි.හෙට්ටිආරච්චි

කමිටු සාමාජික

04. ..................................................

ඩබ්.ඩබ්.එම්.ජ්.එස්.ප්‍රේමකුමාර

කමිටු සාමාජික

05. ..................................................

නීතිඥ ගයනි ප්‍රේමතිලක

කමිටු සාමාජික

06 ..................................................

වි.කේ.නානායක්කාර

කමිටු සාමාජික

07. ..........................................

නිතිඥ වරක ජයරත්න

කමිටු සාමාජික

08. ..........................................

ඩබ්.එම්.එස්.වීරසිංහ

කමිටු සාමාජික

09. .......................................... 2017/4/28

කේ.එම්.ආර්.වික්‍රමසිංහ

කමිටු සාමාජික

10. ..........................................

නිතිඥ පුලස්ති රූපසිංහ

කමිටු සාමාජික

11. ..........................................

ජේ.එම්.ආර්.ජී.ජයසිංහ

කමිටු සාමාජික

12 ..........................................

ශලනි රත්වත්තේ

කමිටු සාමාජික